# සාරාංශය


## ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුවේ න්‍යාය පත්‍රයන්ට අනුව

# පෞද්ගලීකරණය

# කොළඹ වරායේ ඉන්ධන සැපයීම් පෞද්ගලීකරණය

***Amazon Books** – ['IMF, World Bank & ADB Agenda on Privatisation – Vol. 3: Colombo Port Bunkering Privatisation – Annulled as Illegal & Fraudulent by Supreme Court']*

**http://www.consultants21.com/page-1-public-interest-litigations.php**




*විශාලත්වය - 8.25" X 11" - පිටු ගණන 456*

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF), ලෝක බැංකුව (World Bank) සහ ආසියානු සංවර්ධන බැංකු (ADB) වල න්‍යාය පත්‍රය පෞද්ගලීකරණයන් දිරිගැන්වීමයි. මෙම තැතිගන්වන ග්‍රන්ථයෙන් මනාසේ එළිදරව් වන්නේ, කොළඹ වරායේ ඉන්ධන සපයන ඒකාධිකාරිය සහ තෙල් ටැංකි බහාලුම් පහසුකම් අයිතිව තිබූ සහ මෙහෙයුම් කරනු ලැබූ ලංකා මැරයින් සර්විසස් සමාගමේ විශ්මජනක වංචනික පෞද්ගලීකරණය පිළිබඳවය.

මෙම මගඩි පෞද්ගලීකරණය රටේ උත්තරීතරම අධිකරණය වන ශ්‍රේෂ්ඨාධිකරණය විසින්, වැරදි සහගත, නීතිය නොතකා, නීතිවිරෝධී සහ වංචනික ලෙස සිදු කර ඇති බවට තීන්දු කොට, අවලංගු කරන ලදී.

මෙම නඩුවට අදාල සියලු ලේඛන කර්තෘ විසින් පෞද්ගලිකව මෙම කරුණු සමඟ ගනුදෙනු කරමින් සකස් කරනු ලැබූවත්, යම්කිසි ප්‍රයෝගික හේතුවක් මත, එවකට ජනාධිපති මහින්ද රාජපක්ෂගේ උපදේශකයෙකු වූ සහ කර්තෘගේ හිතවත් මිතුරෙකු වූ නීතිඥ වාසුදේව නානායක්කාර පෙත්සම්කරු ලෙස ඉදිරිපත් කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙත්සම ගොනු කරන ලද අතර, කර්තෘ රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ හිටපු සභාපති ලෙස එහි වගඋත්තරකරුවකු ලෙස නම් කරන ලදී.

වාසුදේව නානායක්කාර
ජනාධිපති උපදේශක කාර්යාලය
வாசுதேவ நாணயக்கார
ஜனாதிபதி ஆலோசகர் கரியாலயம்

**මහජන යහපත ශ්‍රේෂ්ඨාධිකරණයේදී අභියෝගයට ලක් වීම**
**ලංකා මැරයින් සර්විසස් සමාගම (LMSL), කොළඹ වරාය නැව් වලට ඉන්ධන සැපයීමේ**
**ඒකාධිකාරය, පෞද්ගලීකරණය සම්බන්ධිතයි**

**එස්.සී (එෆ්.ආර්) අයැදුම් අංක 209/2007**

ඉහත ශෛලියේ ක්‍රියාව මා විසින් ආරම්භ කරන ලද්දේ, නිහාල් ශ්‍රී අමරසේකර මහතාගේ අව්‍යාජ ඉල්ලීම මත වන බවට තහවුරු කරන අතර, සියලුම ලේඛනයන් නීතිඥයන්ගේ උපදෙස් අනුව ඔහු සහ ඔහුගේ කාර්යාලය විසින් සකස් කරන ලදී.

අමරසේකර මහතා වගඋත්තරකරුවකු ලෙස තමා නම් කරමින්, පුළුල්ව ලිඛිත හා වාචික කරුණු ඉදිරිපත් කරමින් පුද්ගලයෙකු තුළ පෙනී සිටිමින් කටයුතු කළ අතර, ලංකා මැරයින් සර්විසස් සමාගම (LMSL), කොළඹ වරාය නැව් වලට ඉන්ධන සැපයීමේ ඒකාධිකාරය, පෞද්ගලීකරණය කිරීම වැරදි සහගත, අයුතු, නීති විරෝධී සහ වංචා සහගත බවට සළකා අවලංගු කර, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් යළි රාජ්‍ය අයිතියට පත් කිරීම ඔහුගේ බලවත් උත්සාහයෙහි ප්‍රතිඵලයකි.

නිහාල් අමරසේකර මහතා සමඟ වන මාගේ දිර්ඝ කාලීන ස්ථාවර පෞද්ගලික මිත්‍රත්වය හේතුවෙන්, මාගේ පරම විශ්වාසය දිනාගත් ඔහු නිර්ව්‍යාජ ලෙස කටයුතු කරන බවට වන විශ්වාසය මත මා විසින් පෙත්සම්කරු ලෙස කටයුතු කිරීමට කැමැත්ත පල කළෙමි.

වාසුදේව නානායක්කාර, පා.ම.

49,1/1, විජයාලංකාර මාවත, කොළඹ - 10.
☎ 011-5874361 ℻ 011-5863938

49,1/1, விஜயாலங்கார வீதி, கொழும்பு - 10
☎ 011-5874361 ℻ 011-5863938

එලෙස වගඋත්තරකරුවකු ලෙස, ඔහු විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ පෞද්ගලිකව පෙනී සිටීමෙන්, ඔහු විසින් විමර්ශනය කල කරුණු අනුව, වාචික සහ ලිඛිත ඉදිරිපත් කිරීම් සාර්ථක ලෙස තහවුරු කර ගෙන, ශ්‍රී ලංකාවේ මහජන උන්නතිය වෙනුවෙන් සහ මහජනයාට ඉමහත් ප්‍රතිලාභයක් අත්කර දෙමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ජයග්‍රාහී විනිශ්චයක් ලබා ගෙන ඇත.

ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් සමාගම ලංකා මැරයින් සර්විසස් සමාගමේ රජයේ කොටස් මිලදී ගැනීමට ඉදිරිපත් වූ "එකම ඉල්ලුම්කරු" වී තිබියදීත් ඔවුනට එය එසේ ලබා ගැනීමට අවස්ථාව දී තිබුණු අතර, ඔවුන් එය එකවරම පිළිගෙන ඇත. එනම්:

**P15(a)**

Annex XI
LMS.

12th July 2002

**Mr. Susantha Ratnayake**
**Director**
**John Keells Holdings Limited**
**130, Glennie Street**
**Colombo 2**

Dear Sir

**Sale of 90 per cent shares of LMSL**

Reference the Undertaking to Pay forwarded by you to purchase the above shares, in terms of the provisions contained in the relevant Request for Proposal document (RFP).

We are pleased to inform you that as per the provisions contained in the RFP, you have been qualified to bid. Since you are the sole qualified party, the bidding process that was envisaged is not warranted. As such it is proposed to conclude the transaction upon the payment of the purchase consideration by you excluding the amount that would be drawn down on your Undertaking to Pay and signing the relevant agreements by July 24th 2002. Please confirm receipt of this letter.

Yours faithfully

P.B. Jayasundera
Chairman

**P16**

**John Keells Holdings**
John Keells Holdings Limited
P.O.Box 76, 130, Glennie Street, Colombo 2, Sri Lanka.
Telephone: 306000 (10 lines) 421101 (8 Lines) Fax: 447087, 439026
e-mail: jkh@keells.com Website: www.keells.com

July 12, 2002

Dr. P.B. Jayasundera
Chairman
Public Enterprise Reform Commission
Level 11, West Tower
World Trade Centre
Colombo 1.

Dear Sir,

SALE OF LANKA MARINE SERVICES (PVT) LTD (LMSL)

Thank you for your letter of award dated 12th July 2002, confirming that John Keells Holdings is the successful bidder for the above transaction.


We are willing to conclude the transaction as set out in your letter dated 12th July, 2002.

Thanking you,

Yours faithfully
JOHN KEELLS HOLDINGS LTD

Susantha Ratnayake
Director

මවිතයට පත් කරන විශේෂත්වයක් ලෙස, එක්සත් ජාතීන්ගේ ගෝලීය සංයුක්ත සමාගමක් වන (UN Global Compact Co.) ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් සමාගම විසින් කොළඹ වරායේ ඉන්ධන සපයන ඒකාධිකාරි ඉන්ධන බහාලුම් ටැංකි වංචාකාරී ලෙස පෞද්ගලීකරණය තුලින්, එය ලබා ගැනීමට ඉල්ලීම් කර තිබූ අවස්ථාවේම, එම කොළඹ වරායේ ඒකාධිකාරි ඉන්ධන සපයන තෙල් ටැංකි පහසුකම් තිබූ ස්ථානයේම අලුතින් ආයෝජනය කර, ඉන්ධන ව්‍යාපෘතියක් දියුණු කිරීමට, ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් සමාගම විසින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) වෙත වරප්‍රසාද සහ සහන ලබා ගැනීමට අයදුම්පතක් ඉදිරිපත් කර තිබුණේ, එම ස්ථානයේම පවතින පහසුකම වූ ලංකා මැරයින් සර්විසස් සමාගම ස්ථාපිත කර තිබූ බව නොහඟවමිනි. - එනම්: ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට ඉදිරිපත් කල ඉල්ලුම්පත.



1. Particulars of Collaborators — Proposed Equity Contribution (Rs. Mn. | %)

a). Name :- JOHN KEELLS HOLDINGS
Address :- NO. 130, GLENNIE STREET, COLOMBO 02
Citizenship :- SRI LANKA
National Identity Card/Passport No. :-
Name & Address of Banker :- BANK OF CEYLON, HATTON NATIONAL BANK, HSBC, NDB
Current Business interests of:- Investor/s INFRA-STRUCTURE, PLANTATIONS, IT, LEISURE, TRANSPORTATION, F&B
Interests in other BOI Projects, if any :-

Project Proposal
2.1 a) New Project [x] (Tick as appropriate)
b) Expansion of Existing BOI Project [ ]
c) Expansion of Existing Non BOI Project [ ]
2.2 Summary of Proposed project
(Give brief description of the project
The primary objective of the project is to supply Heavy Fuel oil & Lubricants to the marine bunker market, whilst exploring the possibilities of supplying the power and similar sectors. This project will maintain the minimum requirement of 70% export income. If possible, the project envisages the purchase and expansion of an existing company in a smimilar business.

Proposed Financing (Rs. Mn.)

| | 2002 YEAR 1 | | | | 2003 YEAR 2 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1 ST HALF | | 2ND HALF | | 1 ST HALF | | 2 ND HALF | |
| | Foreign | Local | Foreign | Local | Foreign | Local | Foreign | Local |
| hare Capital | | | | 261.6 | | | | 102.8 |
| an Capital | | | | 1046.4 | | | | 411.2 |
| thers (Specify) | | | | | | | | |
| OTAL INVESTMENT | | | | 1308.0 | | | | 514.0 |

We certify that the proposal constitutes a new project and does not involve the closure of an existing enterprise of a similar nature or the transfer of any assets from an existing enterprise in Sri Lanka.
me & Designation Mr. Susantha Ratnayake Director
Signature of Investors
Date : 20/03/02
BOARD OF INVESTMENT OF SRI LANKA


Location
1.1 Address of Location 69, WALLS LANE, COLOMBO 15
(Please attach a sketch) OPTION - FLOATING STORAGE /OTHER
1.2 Extent of Land required 8A 2R 21.4P
(in acres of/Sq.Mtrs)
1.3 Ownership of the land
1.4 Covered Space of Buildings
(in Sq.ft/Sq. Mtrs.) 300 - 2,500 sq. ft.
1.5 Whether it is an existing Building Yes

| ITEM | H.P | NO.OF ITEMS | CONDITION USED/NEW. |
|---|---|---|---|
| 1. Upgrading of existing tank forms | | 12 Tanks | 40 Years old |
| 2. New Tanks | | 3 Tanks | |

Name and designations: Mr. Susantha Ratnayake Director
Signature of Investors:
Date: 20/03/02

උපහාසාත්මක ලෙස, සම්පූර්ණයෙන්ම ශ්‍රී ලංකා රජයට අයිති සමාගමක් වූ ලංකා මැරයින් සර්විසස් සමාගම විසින් කොළඹ වරාය තුල ඇති ඒකාධිකාරී තෙල් ගබඩා සහ ඉන්ධන සැපයීමේ පහසුකම් මෙහෙය වූ අතර, එයින් ලැබෙන ලාභය මත ශ්‍රී ලංකා රජයට ආදායම් බදු ගෙවීම් සිදු කර ඇත.

එවකට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) භාරව සිටි අමාත්‍ය ජී.එල්. පීරිස් විසින් 2002 ඔක්තෝබර් මස ප්‍රකාශයට පත්කල අංක 1256/22 දරණ විශේෂ ගැසට් පත්‍රයේ පල කල රෙගුලාසිවලට අනුව, එවකට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ (BOI) සභාපති සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා වූ අර්ජුන මහේන්ද්‍රන්, ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් සමාගම සමග එකඟතාවයකින් ක්‍රියා කොට, තෑගි ගන්වන ලෙස ඔවුන් වෙත විශේෂ සහන සහ ප්‍රතිලාභ ප්‍රදානය කරමින්, එම රජයේ සමාගමේ කොටස් ගැනීමේ ආයෝජනය මත, එකී ලංකා මැරයින් සර්විසස් සමාගමේ රජයේ කොටස් ගැනීමෙන් පසු පුදුමාකාර ලෙස, ඒ වන විටත් ලාභ උපයමින් රජයට ආදායම් බදු ගෙවමින් සිටි එම කොළඹ වරායේ පිහිටි රජයේ සමාගමට, ශ්‍රී ලංකා රජයට බදු නොගෙවීමට සහනයක් ලබා දී තිබුණි.



The Gazette of the Democratic Socialist Republic of Sri Lanka

EXTRAORDINARY

අංක 1256/22 - 2002 ඔක්තෝබර් 01 වැනි අඟහරුවාදා — 2002.10.01

No. 1256/22 — TUESDAY, OCTOBER 01, 2002

(Published by Authority)

PART I : SECTION (I) — GENERAL

Government Notifications

L.D.-B 4/78 III

THE BOARD OF INVESTMENT OF SRI LANKA LAW No. 4 OF 1978

REGULATIONS made by the Minister of Enterprise Development, Industrial Policy, Investment Promotion and Constitutional Affairs under Section 24 of the Board of Investment of Sri Lanka Law, No. 4 of 1978.

G. L. PEIRIS,
Minister of Enterprise Development,
Industrial Policy, Investment Promotion and
Constitutional Affairs.

Colombo,
25th September, 2002.

Regulations

The Board of Investment of Sri Lanka Regulation, No. 1 of 2002 published in *Gazette Extraordinary* No. 1242/29 of 28th June, 2002 are hereby amended as follows : —

(*a*) In regulation 2 thereof, by the insertion, immediately after paragraph (ii) of that regulation, of the following new paragraph (iii) —


"(iii) that the provisions of the Inland Revenue Act, No. 38 of 2000 relating to the imposition, payment and recovery of income tax shall not apply to the profits and income for a period specified in column II below reckoned from the commencement of the commercial operation or production or from a date specified by the Board, of any existing or a new enterprise which is formed by the acquisition of assets of any existing enterprise to engage in the business relating to petroleum, power generation, transmission and development of highways, sea ports, air ports, railways, water services, public transport or any other infrastructure project approved by the Minister with an investment or additional investment of such value as specified in column I below, as the case may be within a period as may be determined by the Board.

| *Column I* Additional/Investment (Rs. Mn.) | *Column II* Tax Exemption period (No. of years) |
|---|---|
| 1,250-2,499 | 05 |
| 2,500-4,999 | 08 |
| Above 5,000 | 10 |

ඉහත කී තත්වය යටතේ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ලබා දී තිබූ ඉහත කී ආදායම් බදු නිදහස් කිරීමද වංචනික යයි නිගමනය කොට, එසේ නොගෙවූ ආදායම් බදු නැවත රජයට අයකර ගන්නා ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නියෝග කරනු ලැබීය.

ඉහත කී නඩුවේ පරීක්ෂණ කටයුතු ශ්‍රේෂ්ඨාධිකරණයේ සිදු කෙරෙමින් පවත්නා අතරතුර, පුදුමාකාර ලෙස තවත් සමාගමක් එනම් සී/ස ශ්‍රී ලංකා ශිපිං සමාගම මැදිහත්කාර-පෙත්සම්කරුවෙකු ලෙස එම ශ්‍රේෂ්ඨාධිකරණ නඩුවට ඉදිරිපත් වී තිබුණි. මැදිහත් - පෙත්සම්කරු විසින් ශ්‍රේෂ්ඨාධිකරණය තුල ස්ථාපිත කරනු ලැබුයේ, ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ්හි කොටස් මිලදී ගැනීම සඳහා ඔවුන් විසින්ද අයැදුම් ඉදිරිපත් කරනු ලැබූ බවයි. එසේ තිබියදී, ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් සමාගම ලංසු සඳහා පූර්ව සුදුසුකම් ලැබුවේ, ඔවුන් ජාත්‍යන්තර සුප්‍රසිද්ධ සමාගමක් වන ෆුවල් ඇන්ඩ් මාර්කටින් LLC සමග ඒකාබද්ධ වී ක්‍රියා කිරීම හේතුවෙනි. එනමුත්, ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් සමාගමට ටෙන්ඩර් පටිපාටිය අනුව තවදුරටත් ක්‍රියා කිරීමට ඉඩදී තිබුණේ, පුදුමාකාර ලෙස එම ජාත්‍යන්තර සුප්‍රසිද්ධ ෆුවල් ඇන්ඩ් මාර්කටින් LLC සමාගම සමග එකඟතාවයක් නොමැතිවය.

ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්තිය වී තිබුණේ වරායේ තෙල් සැපයීමේ ව්‍යාපාරය ලිහිල් කර විවෘත කිරීමටය. - එනම්:



Sunday Observer 28th October, 2001

EXPRESSIONS OF INTEREST

LIBERALISATION OF BUNKERING

The Public Enterprises Reform Commission (PERC), on behalf of the Government of Sri Lanka invites proposals from private sector operators to participate in the marine fuel market in Sri Lanka. Successful applicants will be permitted to import and distribute marine fuel within the territorial waters of Sri Lanka including the ports.

Sri Lanka's strategic positioning in the Eastern Naval Route and its close proximity to the Indian subcontinent offers considerable potential for the development of bunkering which is presently a State monopoly.

There will be no restriction in the number of licenses issued. However licenses will only be issued to limited liability companies that meet with predetermined requirements with regard to bunker vessels.

Interested parties are requested to collect a Request for Proposal (RFP) from PERC which sets out the selection process and specimen application forms.

The RFP may also be downloaded from the PERC website at www.perc.gov.lk

Public Enterprises Reform Commission
Level 11, West Tower
World Trade Center
Colombo 1.
Tele: 94-1-346831-4 Fax: 94-1-326116

PERC

ඒ අනුව මැදිහත්කාර-පෙත්සම්කරුවෙකු වූ සී/ස ශ්‍රී ලංකා ශිපිං සමාගම තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රතික්ෂේප කරන ලද්දේ, ඔවුන් විසින් වර්ෂ 8 ක ඒකාධිකාරිත්වයක් ඉල්ලා සිටි බැවිනි. නමුත් පුදුම සහගත ලෙස, සී/ස ලංකා මැරයින් සර්විසස් සමාගමේ රජයේ කොටස් අවසන් මොහොතේ ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් සමාගමට විකිණීමට අත්සන් කල විකිණීමේ සහ මිලදී ගැනීමේ ගිවිසුම් වල හොර රහසේ කොන්දේසියක් ඇතුලත් කර තිබුණේ, අසීමිත ඒකාධිකාරිත්වයක් සී/ස ලංකා මැරයින් සර්විසස් සමාගම වෙතට අයිති කර දෙමිනි.

මෙම ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් සමාගම විසින් සී/ස ලංකා මැරයින් සර්විසස් සමාගමේ පූර්ණ රජය සතු කොටස් මිලදී ගැනීමට රු. මිලියන 1200/- ක මුදලක් ගෙවීම් කර තිබුණි. සී/ස ලංකා මැරයින් සර්විසස් සමාගමේ ශුද්ධ ලාභය ඉන්පසු පහත සඳහන් පරිදි අනාවරණය වී තිබුණි. - එනම්:

| | රු. |
|---|---|
| මූල්‍ය වර්ෂය 2002/03 | 402,733 |
| මූල්‍ය වර්ෂය 2003/04 | 235,876 |
| මූල්‍ය වර්ෂය 2004/05 | 574,062 |
| මූල්‍ය වර්ෂය 2005/06 | 1,089,393 |

ඉහත ශුද්ධ ලාභය ජෝන් කීල්ස් හෝල්ඩින්ස් සමාගම විසින් සී/ස ලංකා මැරයින් සර්විසස් සමාගමෙන් ඔවුන්ගේ ගාස්තු හා වියදම් අයකිරීමෙන් පසුව වන ශුද්ධ ලාභය නොවේද ?

තවද, කොළඹ වරායේ මෙම ඒකාධිකාරී තෙල් සැපයුම් ආයතනය තක්සේරු කර ඇත්තේ කීර්තිමත් බැංකුවක් වූ ඩීඑෆ්සීසී (DFCC) බැංකුව මගින් මවිත කරවන ලෙස ප්‍රශ්නකාරී ආකාරයකටය. මක් නිසාද යත්, කොළඹ වරාය තුල වූ අක්කර 8½ කින් යුක්ත වූ ඉඩමක් වන එහි 2016 ජූලි 30 වන දිනට වෙළඳපොල වටිනාකම රු. මිලියන 15,000 ක් වූ අතර, සහ ඊට අමතරව ඉන්ධන තෙල් ටැංකි සංකීර්ණය සහ තෙල් නල යටිතල පහසුකම් සහ ඉතාමත් වටිනා ඒකාධිකාරී අයිතියද නොසලකමින්, එසේ තක්සේරු කර ඇති බැවිනි.

5th October, 2004

Mr. Dayantha De Mel
Executive Vice President
DFCC Bank
73/5, Galle Road,
Colombo 03

Dear Sir,

**LMSL VALUATION DATED 10 JUNE, 2002**

I refer to the above business valuation done by DFCC Bank at the request of PERC.

For the purpose of regularizing the land transfer to LMSL, we require confirmation from you whether the value of the land on which LMSL operations were carried out at Bloemendhal Road (approximately 8 Acres) was incorporated into the said valuation and if so, the value and the basis of the value attached to that land.

Thanking you for an early response.

Yours faithfully,

Chandu Epitawala
Director

15

DFCC B/
P O Box 1397
73/5 Galle Road Colombo 03
SRI LANKA
Tel +94-11-2442442
Fax +94-11-2440376
E-mail info@dfccbank.com
Web www.dfccbank.com
DFCC BANK

Mr. Chandu Epitawala
Director
Public Enterprises Reform Commission of Sri-Lanka
11-01, West Tower
World Trade Centre
Echelon Square
Colombo 01

October 12th 2004

Dear Sir,

Valuation of Lanka Marine Services Limited (LMSL)

We refer to your letter of October 5th. 2004 regarding the above assignment undertaken by DFCC Bank for the Public Enterprises Reform Commission in June 2002.

As indicated in our report, the LMSL valuation was carried out on the basis that the company's value was represented by future earnings; in other words that it was a going concern. Accordingly the methodology employed was the discount of future cash flows. These cash flows were projected forward over 15 years and at the end of this period a terminal value for the business was computed. In computing this terminal value, it was assumed, along with other factors, that by the end of the 15-year period, LMSL would have acquired freehold title to the Bloemendhal property following its transfer from the Ceylon Petroleum Corporation. As such, the value of the company would also include the future value of this property

Following consultation with valuers, the value of the land (at the valuation date) was placed at Rs. 150,000/- per perch and it was assumed that this value would appreciate by a factor of 9% per annum (based on inflation) over the 15-year period of the valuation. On this basis, the projected value of the property was estimated at approximately Rs. 699 million at the end of year 15. This figure has accordingly been incorporated into the valuation as a component of the terminal value of the company. This has then been aggregated with the future operational cash flows and discounted to arrive at the present value of the business enterprise.

We trust this provides the clarification sought.

Yours truly

Dayantha De Mel
Executive Vice President (Corporate Finance)

පුදුමාකාර ලෙස අක්කර 8½ කින් යුක්ත වූ මෙම කොළඹ වරායේ දේපලක් පවරා ඇත්තේ වංචනික ඔප්පුවක් මත ජනරජයේ නිල මුද්‍රාව සහ විධායක ජනාධිපතිව සිටි චන්ද්‍රිකා කුමාරතුංග විසින්ම, එතුමියගේ අත්සන තැබීමෙන් ඇයගේ ප්‍රදාන පත්‍රයක් මත වන අතර, විශ්මයජනක ලෙස හෙළිදරව් වන්නේ එවැනි ප්‍රදාන පත්‍රයක් පැවතියද, එම ඉඩමට එදින රු. 1,199,362,500/- ක මුදලක ගෙවීමක් භාණ්ඩාගාරයට ලැබී තිබුණු බවට සනාථ කර තිබූ බවයි.

[redacted]


(Section 23(3) of the Crown Lands Ordinance (Cap. 454)

of the Crown Lands Ordinance

01 FEB 2005
3664

( 1,199,362,500.00 )

කෙසේ වෙතත්, පසුව රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) විසින් විමර්ශනය කිරීමේදී භාණ්ඩාගාරය විසින් ලිඛිතව දන්වා සිටියේ එවැනි මුදලක් ලැබී නොතිබුණ බවය.


PUBLIC ENTERPRISES REFORM COMMISSION OF SRI LANKA

PERC

ANNEX 38

March 21, 2006

Dr P.B. Jayasundera
Secretary to the Treasury
General Treasury
The Secretariat
Colombo 1.

Dear Sir,

Transfer of Land at No 69, Wall's Street, Colombo 15


As per our records, the subject Land was purchased by Lanka Marine Services (Pvt) Ltd on 19.1.2005 for a sum of Rs 1,199,362,500/= (Rupees One Billion, One Hundred & Ninety Nine Million, Three Hundred & Sixty Two Thousand, Five Hundred).

Please confirm whether the Government received the above consideration as stated in the attached documents.

Yours faithfully,

W M Bandusena
Chairman.

Attachments a/s


PE/D(I)/Marine/02

23.08.2006

ANNEX 39

Chairman,
Public Enterprises Reform Commission.

Transfer of Land at No. 69 , Wall's Street, Colombo 15.

This refers to the your letter dated 21.03.2006 on the above subject.

Director General, Department of Treasury Operation has confirmed that they have not received any money on this regard.

K.P. Indran
Director
For Director General

ඊට අමතරව, මෙම ඉඩමේ අයිතිය ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතුව තිබූ අතර, ශ්‍රී ලංකා වරාය අධිකාරිය ස්ථාපිත කල ශ්‍රී ලංකා පාර්ලිමේන්තු පනත ප්‍රකාරව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු ඉඩම් අන්සතු කිරීමට සහ / හෝ විකිණීමට ඔවුන්ට කිසිදු බලයක් නොමැත.

රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) විසින් විගණකාධිපතිගේ විමර්ශනාත්මක වාර්තා මත විශේෂ ලෙස, මෙම කොළඹ වරායේ ඉන්ධන සපයන ඒකාධිකාරි තෙල් ටැංකි සමාගමේ විශ්මජනක පෞද්ගලීකරණ ගනුදෙනුව, එවකට රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපති ලෙස ක්‍රියා කල කර්තෘගේ සහායද ඇතුව විමර්ශනය කොට, එය බැලූ බැල්මට වංචා සහගත, නීත්‍යානුකූල නොවන බව නිගමනය කරමින්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට ඒ මත පහත සඳහන් වාර්තාව ඉදිරිපත් කර තිබුණි. !

**" ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ්හි (LMSL) කොටස් 90 % ක් විකිණීම**

1. 2000.8.17 දිනැතිව අමාත්‍ය මණ්ඩලය විසින් පහත වගන්ති යටතේ ඉන්ධන සැපයුම් සේවා ලිහිල් කිරීමට තීරණය කරන ලදී.

   - ඉන්ධන සැපයුම් අංශය ලිහිල් කර, සීමාසහිත පාර්ශවයන් කිහිපයකට ඉන්ධන සැපයුම් සේවා මෙහෙයවීම සඳහා අවසර ලබා දීම

   - ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) වෙත ලබා දී ඇති ඒකාධිකාරය එක් වර්ෂයකට සීමා කර, එම කාලය තුලදී ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) පෞද්ගලීකරණය කිරීම සම්පූර්ණ කිරීම

   - ශ්‍රී ලංකාවේ ඉන්ධන සැපයීමේ අංශයේ වෙළඳාමට ඇතුළු වන නවකයින්හට කොළඹ වරාය ආසන්නතම ප්‍රදේශය ඇතුලත්ව ශ්‍රී ලංකාවේ දේශීය සමුද්‍ර තීරය ඇතුලත ඉන්ධන සැපයීම් විකිණීමට අවස්ථාව සළසා දීම

   - විවෘත ටෙන්ඩර් ක්‍රියාවලියක් මගින් අවශ්‍ය තාක්ෂණික සහ මූල්‍ය හැකියාව සහ ඉන්ධන සැපයීමේ පලපුරුද්ද සහිත ආයෝජකයින්ගෙන්

ඉල්ලුම් පත් කැඳවීමට පවතින හැකියාව පිළිබඳ පර්ක් විසින් සොයා බැලීම

- රජය විසින් බලාත්මක කරන ලද 2002 අංක 33 දරණ ඛනිජ තෙල් නිෂ්පාදන (විශේෂ ප්‍රතිපාදන) පනත අනුව, ඉහත කාර්යයන් සඳහා පහසුකරණය කිරීම

2. පර්ක් විසින් 2001.10.28 දිනැතිව ඉන්ධන සැපයුම් සේවා සඳහා බලපත්‍ර නිකුත් කිරීමට කැඳවනු ලැබූ උනන්දුව දැක්වීමේ ප්‍රකාශ (EOI) සහ ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි 90 % කොටස් විකිණීම සඳහා කැඳවනු ලැබූ උනන්දුව දැක්වීමේ ප්‍රකාශ (EOI) වල අවසන් දිනය 2002.2.28 වූ අතර, ඒ සඳහා සති තුනක් පමණක් ලබා දී තිබුණි.

3. 2002.2.28 දින, පර්ක් හි සභාපති පී. බී. ජයසුන්දර විසින් මහාභාණ්ඩාගාර ලේකම් චරිත රත්වත්ත හට උනන්දුව දැක්වීමේ ප්‍රකාශ (EOI) සහ අවසන් ලංසු යන දෙකම ඇගයීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කිරීමට කටයුතු සළස්වන ලදී. අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලැබූ ටෙන්ඩර් මණ්ඩලයක් මේ සඳහා පත් කර නොමැත. තාක්ෂණික ඇගයීම් කමිටුව 2002.2.28 දිනෙන් පසුව පත් කල බැවින්, උනන්දුව දැක්වීමේ ප්‍රකාශ (EOI) කැඳවීම් සහ අදාළ ලේඛන තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අනුමත කර නොමැත.

4. 2002.4.30 දිනැතිව පැවති 'ලංසු තැබීමේ පූර්ව සාකච්ඡාවේදී' පර්ක් හි සභාපති පී. බී .ජයසුන්දර විසින් පහත තහවුරු කිරීම සිදු කරන ලදී;

- "ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) වෙත සිදු කරන විකිණීමෙන් පසුව ඉන්ධන සැපයුම් සේවාවන්හි විකිණීම සහ ආනයනය සඳහා ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) සතුව ඒකාධිකාරයක් නොමැත. "

- "රජයට අධිකරණ නඩු පවරා ගත නොහැකිය. "

- "ඉඩම් - අවසාන දින සිට වසරක් ඇතුලත - ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) විසින් ගෙවිය යුතු වන ගෙවීම් ඇතුළුව පැවරීමේ විධිවිධානයන්ට අදාළව, 2002 මැයි 7 වන දින වන විට පර්ක් විසින් වාර්තා කල යුතුය."

5. යෝජනා සඳහා ඉල්ලීම් (RFP) හි සඳහන් කර ඇත්තේ;

- "ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ඩොල්ෆින් ජැටිය භාවිතා කිරීමට සහ නල මාර්ගයන් බ්ලූමැන්ඩල් දක්වා සවිකිරීම සඳහා ඇ. ඩො. 10 / මෙ. ටො. ගාස්තුවක් දක්වනු ලැබ ඇත."

- ශ්‍රී ලංකා වරාය අධිකාරිය (SLPA) විසින්, දකුණු ජැටිය පොදු භාවිතා කරන්නන්ගේ පහසුකම ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කර ඇති අතර, ඒ වෙනුවෙන් කාර්යාල ඉඩ සඳහා වර්ග අඩි 1 කට ඇ. ඩො. 3 ක් ලෙස ගාස්තුව දක්වනු ලැබ ඇත."

- "ලංසු තබන්නන් ඔවුන් විසින්ම නිදහස් පර්යේෂණයක් සිදු කල යුතු සහ ඒ සඳහා තනිවම වගකිව යුතු වේ .............. ලංසු තබන්නන් ඔවුන්ගේ ක්‍රියා ශූරභාවය / උද්යෝගීභාවය අනුව කටයුතු කල යුතු අතර ඒ සඳහා තනිවම වගකිවයුතු වේ. ................... ලංසු තබන්නන් විසින් නීත්‍යානුකූලව බැඳ සිටීම සළකා ලිඛිත හෝ වාචික තොරතුරු ලබා දීමක් නොමැත. "

6. පර්ක්හි සභාපති පී. බි. ජයසුන්දර විසින්, ප්‍රධාන තක්සේරුකරුගේ 1993 වර්ෂයේ ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි ඇගයීම ඔහු වෙත යොමු කරමින්, ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි යාවත්කාලීන කරන ලද ඇගයීමක් ප්‍රධාන තක්සේරුකරුගෙන් කැඳවා ඇති අතර, ඒ අනුව ප්‍රධාන තක්සේරුකරු විසින් 'වත්කම් ඇගයීම' සම්පූර්ණ කර ඇති බව තහවුරු කර සහ 'ව්‍යාපාරික ඇගයීම' ආරම්භ කිරීමට නියමිත බව දන්වා ඇත.

7. ප්‍රධාන තක්සේරුකරුගේ ඇගයීම ප්‍රශ්නකාරී ලෙස අතහැර දැමූ පර්ක් විසින්, කිසිදු තරඟකාරී අවස්ථාවකින් තොරව ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි 'ව්‍යාපාරික ඇගයීම' සිදු කිරීම සඳහා ඩීඑෆ්සීසී බැංකුව තෝරා ගෙන ඇත. ඩීඑෆ්සීසී බැංකුව විසින්, ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හට ඒකාධිකාරයක් නොමැති සේ සළකා, ලංසු මිල රු. 1,200,000,000/- කට 'ව්‍යාපාරික ඇගයීමෙහි' 'බිම් වටිනාකම' තබා ඇත. ඩීඑෆ්සීසී බැංකුවේ ඇගයීම වැරදිසහගත ද වේ.

ප්‍රධාන තක්සේරුකරු විසින් සම්පූර්ණ කර ඇති බවට තහවුරු කරනු ලැබූ, නමුත් පර්ක් විසින් ප්‍රශ්නකාරී ලෙස මඟ හරිනු ලැබූ අක්කර 8 රූඩ් 2 පර්චස් 21.44 ක බ්ලූමැන්ඩල් ඉඩම, ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි ශුද්ධ වත්කම් අගය කිරීමේදී ඩීඑෆ්සීසී බැංකුව විසින් සවිස්තරව අගය කර නොමැත.

සාමාන්‍යයෙන් පවත්නා ව්‍යාපාරයක ඇගයීම් කිරීමේදී, 'ශුද්ධ වත්කම් ඇගයීම' සහ 'ව්‍යාපාරික ඇගයීම' යන දෙකම ගණනය සඳහා යොදා ගනු ලබයි.

8. කොළඹ කොටස් වෙළඳපොල හුවමාරුව මත ලංසු ක්‍රියාවලියේ කටයුතු කරමින්, ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි 90 % කොටස් විකිණීම සඳහා 'බිම් වටිනාකම' රු. 1,200,000,000/- පදනම ලෙස ගෙන, තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලබා

දුන් නිර්දේශ මත විදුලි බල හා බල ශක්ති අමාත්‍ය කරු ජයසූරිය විසින් 2002.6.21 දිනැතිව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරමින්, පහත අමාත්‍ය මණ්ඩල අනුමැතීන් ඒ සඳහා බලාපොරොත්තු වී ඇත.

- කොටස් විකිණීමේ සහ මිලදී ගැනීමේ ගිවිසුමෙහි සහ පොදු භාවිතා කරන්නන්ගේ පහසුකම (CUF) ගිවිසුමෙහි නියම කරනු ලැබූ විධිවිධාන සහ කොන්දේසි සහ හඳුනාගනු ලැබූ ක්‍රමවේදය මත සාර්ථක ලංසු තබන්නා හට ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) 90 % කොටස් විකිණීම සඳහා සහ ඉතිරි 10 % ක කොටස් ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් හි සේවකයින් වෙත තෑගි කිරීම සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට බලය පැවරීම.

- කොළඹ කොටස් වෙළඳපොල හුවමාරුවේ ලංසු ක්‍රමවේදය මත හඳුන්වා දෙනු ලැබූ, රු. 1,200,000,000/- ක 'මිනුම් ප්‍රමිතිය / බිම් වටිනාකම' මත පදනම්ව, 19 වන වගඋත්තරකාර ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) 90 % කොටස් විකිණීම සඳහා බලය පැවරීම.

- කොටස් විකිණීමේ සහ මිලදී ගැනීමේ ගිවිසුම සහ පොදු භාවිතා කරන්නන්ගේ පහසුකම (CUF) ගිවිසුම සහ වෙනත් සහායක ගිවිසුම් සඳහා ඇතුලත් වීමට, මහාභාණ්ඩාගාර ලේකම්ට, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සහ ශ්‍රී ලංකා වරාය අධිකාරයට බලය පැවරීම.

- යෝජිත පර්යන්ත සමාගම සකස් වී අවසන් වන තෙක්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සමඟ සහයෝගයෙන් පොදු භාවිතා කරන්නන්ගේ පහසුකම් අත්පත් කර ගැනීමට සහ කළමනාකරණය කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියට බලය පැවරීම.

- පොදු භාවිතා කරන්නන්ගේ පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය වන කාර්යයන්හිදී, ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) 90 % කොටස් විකිණීමෙන් බහු-භාවිතා හැකියාව සහිත සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හෝ වෙනත් පාර්ශවයකට එම කාර්යයන් සඳහා, එම වෙන් කරන ලද අරමුදල් ලබා දීමට බලතල පැවරීම.

  මෙම බිලූමැන්ඩල් ඉඩමෙහි වපසරිය අක්කර 8 රූඩ් 2 පර්චස් 21.44 ක් බව සහ වෙළඳපොල වටිනාකම, 2002.6.21 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් ප්‍රකාශිත ලෙස හෙළි කර නොතිබුණි.

9. 2002.6.21 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2002.8.14 දිනැතිව පමණක් ලබා දී, අමාත්‍ය මණ්ඩල තීරණය තහවුරු කිරීම සහ දැනුම් දීම 2002.8.21 දිනැතිව පමණක් සිදු කල බැවින්, **2002.6.21 සහ 2002.8.21 අතර කාලය තුල මෙම කරුණ සම්බන්ධයෙන් කිසිදු පියවරක්, මොනම අයුරකින් වත් ගත නොහැකිය.**

10. 2002.8.21 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය තහවුරු කිරීමට සහ දැනුම් දීමට ප්‍රථම, පර්ක් හි සභාපති පී. බී. ජයසුන්දර;

    i. ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් වෙත, ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) 90 % කොටස් විකිණීම 'ප්‍රදානය' කරමින් 2002.7.12 දිනැතිව ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් සමඟ ලිපි හුවමාරු කර ගන්නා ලදී.

    ii. ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් වෙත ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) 90 % කොටස් විකිණීම 'ප්‍රදානය' කිරීම 2002.7.12 දිනැතිව සිදු කරන ලද්දේ, 2002.6.25 දිනැති ලිපිය මගින් දන්වා ඇති පරිදි, 2002.7.10 දින වනවිට 'මිනුම් ප්‍රමිතිය / බිම් වටිනාකම, අනුව රු. 1,200,000,000/- ක වටිනාකමකින් යුතු 10 % ක ලංසු බැඳුම්කරයක් ඉදිරිපත් කල එකම පාර්ශවය ඔවුන් පමණක් බවට පදනම වශයෙන් සළකමිනි. මෙය 'සාපරාධී ක්‍රියාවක්' බව අනෙකුත් ලංසු තබන්නන් විසින් දෝෂාරෝපණය කරනු ලැබ ඇත.

    iii. ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් විසින් ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) 90 % කොටස් මිලදී ගැනීමෙන් අනතුරුව, 2002.7.12 දිනැතිව ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් සමඟ ලිපි හුවමාරු කර ගනිමින්, ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) වෙත 'ඒකාධිකාරය' ප්‍රදානය කිරීමට පර්ක් හි සභාපති පී. බී. ජයසුන්දර විසින් එකඟතාවය පල කර ඇත.

    iv. 2002.8.20 දින, පර්ක් හි සභාපති පී. බී ජයසුන්දර, මහාභාණ්ඩාගාර ලේකම් චරිත රත්වත්ත සහ පර්ස් හි නීති අධ්‍යක්ෂක ශ්‍යාමලී ගුණවර්ධන එකට එකතුව අනුකූලව කටයුතු කරමින්, ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් සමඟ කොටස් විකිණීමේ සහ මිලදී ගැනීමේ ගිවිසුම සහ පොදු භාවිතා කරන්නන්ගේ පහසුකම් ගිවිසුම (CUF) අත්සන් කරන ලදී. පොදු භාවිතා කරන්නන්ගේ පහසුකම් ගිවිසුම (CUF) සඳහා පූර්වයෙන් ඇතුලත් කර නොතිබුණු පහත නව වගන්තිය 8.2 ඇතුලත් කර ඇත.

**" 8.2 - කොළඹ වරාය ඇතුලත මෙහෙයවනු ලබන සහ ප්‍රවාහනය කරනු ලබන සියලුම ඉන්ධන සැපයුම්**

**සේවා / නාවික ඉන්ධන, පොදු භාවිතා කරන්නන්ගේ පහසුකම භාවිතා කරමින් මෙහෙයවීම සහ ප්‍රවාහනය කිරීම සිදු කෙරෙන බවට ශ්‍රී ලංකා රජය / ශ්‍රී ලංකා වරාය අධිකාරිය / ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් තහවුරු කල යුතුය. "**

ඉහත ක්‍රියාවන් සිදු කර ඇත්තේ අමාත්‍ය මණ්ඩල තීරණය 2002.8.21 දින තහවුරු කිරීමට සහ දැනුම් දීමට පූර්වයෙන් බැවින්, එය නීතියේ ඉදිරියේ වැරදි සහ අවලංගු, ශූන්‍ය සහ බල රහිත වේ.

11. 2002 අංක 33 දරණ ඛනිජ තෙල් නිෂ්පාදන (විශේෂ ප්‍රතිපාදන) පනත අතරතුර, ඉහත 'ඒකාධිකාරය' වගන්තිය අන්තර්ගත කර ඇති බවට අභියාචනාධිකරණය විසින් පිළිගෙන ඇත.

12. ප්‍රතිඵලය වශයෙන්, ඉහත ඒකාධිකාරය වගන්තිය සම්බන්ව ගැටෙමින්, ඩීඑෆ්සීසී බැංකුව අදහස වෙනස් කර අති අතර, ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි ව්‍යාපාරික ඇගයීම රු. 1,200,000,000/- වෙනස් කරමින්, 'ඒකාධිකාරය' මත පදනම්ව ඔවුන්ගේ ව්‍යාපාරික ඇගයීම රු.2,400,000,000/- ලෙස ලිඛිතව දන්වමින්, ඔවුන් විසින් ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි 'ශුද්ධ වත්කම් ඇගයීමක්' ලබා දීම අවශ්‍ය වූයේ නම්, එවැනි අරමුණක් සඳහා අක්කර 8 රූඩ් 2 පර්චස් 21.44 ක බ්ලූමැන්ඩල් ඉඩම අගය කිරීමට ඔවුන් විසින් වෘත්තීයමය ඇගයුම්කරුවකුගේ සේවාවන් සමඟ සම්බන්ධව කටයුතු කල හැකිව තිබුණු බව දන්වා ඇත.

13. 2004 මහ බැංකු වාර්ෂික වාර්තාවේ පිටු අංක 64 හි පහත පරිදි ප්‍රකාශිතය.

**" ඉන්ධන සැපයුම් සේවාවන්හි ඉහළ මිල, ඉන්ධන සැපයුම් සේවා ලබා ගැනීම සඳහා කොළඹට පැමිණෙන යාත්‍රා පද්ධතිය අධෛර්යමත් කරනු ඇත. ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) පෞද්ගලීකරණයේදී, මෙම අංශයෙහි වැඩිදුර ප්‍රතිසංස්කරණ සඳහා අවශ්‍යතා අභවමින්, අවශ්‍ය වූ පහළ මිල සහ තරඟකාරීත්වය ලැබී නැත. "**

14. පර්ක් හි සභාපති පී. බී. ජයසුන්දර විසින් 'ලංසු තැබීමේ පූර්ව සාකච්ඡාවේදී' තහවුරු කර ඇති පරිදි, **යෝජනා සඳහා ඉල්ලීම් (RFP) මගින් පහත නඩුව සහ රජය විසින්** ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි නඩු පවරා ගැනීම සිදු නොකල යුතු බව **හෙලි කර ඇතත්, ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (පෞද්ගලික) සමාගම සමඟ අත්සන් කල කොටස් විකිණීමේ සහ මිලදී ගැනීමේ ගිවිසුමේදී,** සිංගප්පූරුවේ ඔක්ස්ෆර්ඩ් ජේ ඉන්ටර්නැෂනල් (පෞද්ගලික) සමාගම විසින් අයදුම් කරනු ලැබූ ඇ. ඩො. මිලියන 9.2 ක හිමිකමක් රජය විසින් පවරා ගෙන ඇත. රජය විසින් අත්තිකාරම් ලෙස ඇ. ඩො.170,000/- ක අමතර වටිනාකමක් ගෙවනු ලැබ ඇත.

15. යෝජනා සඳහා ඉල්ලීම් (RFP) සමඟ නිකුත් කරනු ලැබූ කොටස් විකිණීමේ සහ මිලදී ගැනීමේ ගිවිසුම් කෙටුම්පතෙහි පහත පරිදි දක්වා ඇත;

**" විකුණුම්කරු (එනම් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව) කොළඹ 15, වෝල්ස් පටුමගෙහි අංක.69 පිහිටා ඇති පරිශ්‍රයෙහි වන ඉඩමෙහි සින්නක්කර අයිතිය සමාගමට (එනම් ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) ට) අවසන් දිනයේ සිට වසරක් ඇතුලත පැවරීමට එකඟ වෙයි. "**

**ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි ගැනුම්කරුගේ 'අසාධාරණ පෝෂණය කිරීම' සඳහා අක්කර 8 රූඩ් 2 පර්චස් 21.44 ක් වූ බ්ලූමැන්ඩල් ඉඩමේ 'වටිනාකම සැළකීමෙන් නිදහස් කිරීම' අනුව පැවරීමට රජය කැපවෙන බව ඉහත කරුණු වලින් අදහස් කල නොහැකිය.**

'ලංසු තැබීමේ පූර්ව සාකච්ඡාවේදී' 8 වන වගඋත්තරකාර පර්ක් හි සභාපති විසින් පහත තහවුරු කිරීම සිදු කරන ලදී;

**"ඉඩම් - අවසාන දින සිට වසරක් ඇතුලත - ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) විසින් ගෙවිය යුතු වන ගෙවීම් ඇතුළුව පැවරීමේ විධිවිධානයන්ට අදාළව, 2002 මැයි 7 වන දින වන විට පර්ක් විසින් වාර්තා කල යුතුය."**

16. විදුලි බල හා බල ශක්ති අමාත්‍යාංශයේ ලේකම් පී. වීරහැන්දි විසින් ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) වෙත මෙම ඉඩම පැවරීම සඳහා 2004.11.3 දිනැතිව කටයුතු ආරම්භ කර ඇත. ප්‍රතිඵලය වශයෙන්, 2005.1.11 දිනැතිව ඉඩම් අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ඩබ්. එම්. ජයතිලක විසින් ප්‍රකාශ කර ඇත්තේ, ගැනුම් සැළකීම ලෙස රු. 1,199,362,500/- ක අලාභය අයකර ගැනීමෙන් පසුව, මෙම ඉඩමෙහි අයිතිය ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) වෙත පවරන ලෙසට ජනාධිපති විසින් අනුමැතිය ලබා දුන් බව ජනාධිපති ලේකම් විසින් ඉඩම් කොමසාරිස් වෙත දන්වා ඇති බවයි.

17. 2005.1.19 දිනැති ප්‍රදානය කිරීමේ සාධන පත්‍රයෙහි රජය වෙත ගැනුම් සැළකීමේ වටිනාකම රු. 1,199,362,500/- ක ලද බව සඳහන් කර තිබුනද, එකී ප්‍රදානය කිරීමේ සාධන පත්‍රයෙහි සඳහන්ව ඇති පරිදි රජය වෙත ගැනුම් සැළකීමේ වටිනාකම ලැබුනේද යන්න තහවුරු කර ගැනීම සඳහා, පර්ක් හි සභාපති ඩබ්. එම්. බන්දුසේන විසින් මහාභාණ්ඩාගාරයේ ලේකම් පී. බී. ජයසුන්දර වෙත 2006.3.21 දිනැති ලිපිය යොමු කරමින් කරනු ලැබූ විමසීමට පිළිතුරු

යොමු කරමින්, මෙම ඉඩම පැවරීම සම්බන්ධයෙන්, අදාළ ප්‍රදානය කිරීමේ සාධන පත්‍රය හරහා රජය වෙත ලද බවට සඳහන් කර ඇති රු. 1,199,362,500/- ක මුදල, රජය වෙත ලැබී නොමැති බව, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින්, ඔහුගේ 2006.8.18 දිනැති ලිපිය මගින් තහවුරු කරනු ලැබ ඇත.

**අක්කර 8 රූඩ් 2 පර්චස් 21.44 ක බ්ලූමැන්ඩල් ඉඩම සඳහා රජය වෙත රු. 1,199,362,500/- ක ගෙවීමක් සිදු කර ඇති බවට ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි 2005.3.31 න් අවසන් මූල්‍ය වර්ෂය සඳහා වන ගිණුම් මගින් හෙළි කර නොමැත.**

සත්‍ය වශයෙන්ම කියතොත්, රු. 1,199,362,500/- ක ගෙවීම 2002 අගෝස්තු මස, ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි 90 % ක කොටස් විකිණීම සඳහා මහාභාණ්ඩාගාරයේ ලේකම් වෙත ගෙවීමට, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් ලිමිටඩ් විසින් ගෙවනු ලැබූ වටිනාකම වන අතර, එම වටිනාකම 2005 ජනවාරි මස ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) විසින් මෙම ඉඩම සඳහා මහාභාණ්ඩාගාරයේ ලේකම් වෙත සිදු කල ගෙවීමක් ලෙස අර්ථ දැක්වීමට සහ විග්‍රහ කිරීමට නොහැකිය.

18. ඒ අනුව, 2005 ජනවාරි මසදී, රු. 1,199,362,500/- ක 'අදහස් කල ගෙවීමක්' ලැබීම මත, මෙම රජයේ ඉඩම එවැනි 'කිසිදු සැලකීමක් ලැබීමකින් තොරව' රජය විසින් ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) වෙත අදහස් කරනු ලැබූ 'පැවරීම' සිදු කර ඇත.

එබැවින්, එකී ප්‍රදානය කිරීමේ සාධන පත්‍රය 'වංචාසහගත ලේඛනයක්' සහ 'ප්‍රබන්ධයක්' වන අතර, ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) වෙත රජය විසින් එකී අක්කර 8 රූඩ් 2 පර්චස් 21.44 ක බ්ලූමැන්ඩල් ඉඩම පැවරීම සඳහා, එකී ප්‍රදානය කිරීමේ සාධන පත්‍රයෙහි දන්වා ඇති පරිදි, ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) විසින් ගෙවන ලද බව සහ රජය වෙත ලද බව සඳහන් පරිදි, ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) විසින් ගෙවීමක් සිදුකර නොමැත. එබැවින්, මෙම ඉඩම පැවරීම නීතිමය පැවරීමක් නොවන අතර, එය ප්‍රදානය කිරීමේ සාධන පත්‍රය සේම වංචාවක් සහ 'ප්‍රබන්ධයකි'.

19. කොටස් විකිණීමේ සහ මිලදී ගැනීමේ ගිවිසුම ක්‍රියාත්මක වන 2002 අගෝස්තු වන විට, මෙම ඉඩමේ වෙළඳපොල වටිනාකම ප්‍රධාන තක්සේරුකරුගේ සහ වෘත්තීය පෞද්ගලික තක්සේරුකරුගේ ඇගයීම් මගින් හෙළි කර ඇත.

20. 2002 ජූනි මස ඩීඑෆ්සීසී බැංකුව විසින් ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි 2002/03 මූල්‍ය වර්ෂය සඳහා 'ඉපයීම් මත පදනම්ව' සිදු කරනු ලැබූ 'ව්‍යාපාරික ඇගයීම' ගණනය කිරීමේදී, ගුණාකාර 8 ක් මත රු. මිලියන 1,405 සහ ගුණාකාර 10 ක් මත රු. මිලියන 1,757 ක් ලෙස ලබා දී ඇත.

කෙසේ වුවද, පහත වර්ෂයන් සඳහා ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි බදු වලින් පසු ශුද්ධ ලාභයන් පහත පරිදි වේ.

| | | රු. |
|---|---|---|
| මූල්‍ය වර්ෂය 2002/2003 | - | 402,733 |
| මූල්‍ය වර්ෂය 2003/2004 | - | 235,876 |
| මූල්‍ය වර්ෂය 2004/2005 | - | 574,062 |
| මූල්‍ය වර්ෂය 2005/2006 | - | 1,089,393 |

ඉහත ශුද්ධ ලාභයන් ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් ලිමිටඩ් විසින් ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) වෙතින් ගාස්තු සහ පිරිවැය අය කර ගැනීමෙන් පසුව වේ.

**21. මෙම ගනුදෙනුව රජය වෙත අලාභ සහ හානියකට හේතු වෙමින්, ප්‍රශ්නකාරී තත්වයක් තහවුරු කරන බව 'ආදර්ශනය' කරමින්, අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව, නිතීනව නිර්ලජ්ජිත ලෙස ක්‍රියාත්මක වී ඇති බැවින්, මුල පටන්ම නීතිය ඉදිරියේ වැරදි, ශූන්‍ය සහ බල රහිත වේ. "**


ඉහත කී ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චය තුල, එවකට මුදල් අමාත්‍යාංශ ලේකම් පී. බී. ජයසුන්දරට සහ ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් සමාගමේ සභාපතිව සිටි සුසන්ත රත්නායකට තරයේ චෝදනා ගණනාවක් ලැයිස්තු ගත කර ඇත. අනාවරණය වී ඇති මෙම ක්‍රියාවන් සහ සිදුකිරීම් ප්‍රජාතන්ත්‍රවාදයට සහ විවෘත ආර්ථිකයට අහිතකර වේ.

ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව මත, මුදල් අමාත්‍යාංශ ලේකම් පී. බී. ජයසුන්දර විසින් රජයට වන්දියක් වශයෙන් රුපියල් ලක්ෂ 5 ක මුදලක් ගෙවීමට සහ ඔහු මුදල් අමාත්‍යාංශයේ සහ භාණ්ඩාගාරයේ ලේකම්

තනතුරින්  සහ ඔහු විසින් දරණ අනෙකුත් සියලුම රාජ්‍ය ආයතනයන්හි තනතුරු වලින් වහාම ඉල්ලා අස්වන ලෙස  සහ, රජයේ කිසිම තනතුරක් නොදැරිය යුතු බවට  තීන්දු කරන ලදී. එම නියෝගය අනුව එසේ කරන බවට ප්‍රකාශ කර, දිවුරුම් දෙමින්, ඔහු විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට දිවුරුම් පෙත්සමක් ද ඉදිරිපත් කර තිබුණේ,  ඍජුව හෝ වක්‍රව කිසිදු රජයේ තනතුරක් දැරීමට ක්‍රියා නොකරන බව සඳහන් කරමිනි.


තවද පුදුමාකාර ලෙස එළිදරව් වන්නේ, ප්‍රජාතාන්ත්‍රික නායකයන්, විශාල සමාගම් සහ  වෘත්තිකයින් මෙවැනි වංචා සහ දූෂණ කිරීම විශේෂයෙන්ම රජයේ දේපල මංකොල්ලකෑම වැනි නින්දිත අපරාධ පිළිබඳව නොදුටු සේ ඇස් කන් පියාගෙන සිටින අතර,  සහ  ඉන් අනතුරුව මහජනයාගේ අධිකරණ බලය එයට එරෙහිව අභ්‍යාස කිරීමද වැලැක්වීමට කටයුතු කරන බවය. අනෙක් අතට, ඉතාමත් නිර්ලජ්ජිත ඛේදජනකයක් වන්නේ එම වංචනික ආයතනික  නායකයන්ට වාණිජ මණ්ඩල වල ඉහල පිළිගැනීමක් ලබා දීමයි.

තවත් පුදුමාකාර ලෙස වන එළිදරව්වක් වන්නේ, එක්සත් ජාතීන්ගේ ගෝලීය සංයුක්ත සමාගමක් වී සිටි ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් සමාගම, ඔවුන් දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සම්මුතියේ පටිපාටියට අනුව  ක්‍රියා කිරීමට සහ එය ආරක්ෂා කිරීමට බැඳී සිටින අතර, ඒ නමුත් එයට පරස්පර  ලෙස, එම ක්‍රියා පටිපාටිය උල්ලංඝනය කරමින් සමාජයීය සහ දේශපාලන යථාර්ථය එමගින් පිළිඹිබු කර පෙන්නුම් කර සිටින අතර, එය ප්‍රබන්දයක් පමණක් ලෙස කටයුතු කිරීමය.  තවද, ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් සමාගම, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව යටතේ පාලනය වන ලැයිස්තුගත පොදු සමාගමකි.



මෙම ග්‍රන්ථයෙන් තවදුරටත් හෙළිදරව් වන්නේ, යහපාලනය, විනිවිදභාවය සහ වගවීමේ සම්මතයන් පැහැර හැර, 'නීතියේ ආධිපත්‍යය' තඹයකටවත් නොතකමින්, ප්‍රබල රාජ්‍ය නිලධාරීන් සහ පෞද්ගලික අංශයන්හී උසස් ව්‍යාපාරකයින් නිර්ලජ්ජිත ලෙස, ජාතික සහ මහජන අයිතීන් වලට පයින් ගසමින්, වටිනා මහජන දේපල කොල්ල කෑමෙන් ව්‍යවස්ථාගත වගකීම් උල්ලංඝනය කිරීමය.

ඉන්පසුව, අගවිනිසුරු සරත් එන් සිල්වා විශ්‍රාම යාමත් සමග, අගවිනිසුරු අසෝක ද සිල්වා ප්‍රමුඛ ශිරාණි බණ්ඩාරනායක, ශිරාණි තිලකවර්ධන, ඩී. ජේ. ද එස්. බාලපටබැදි, එස්. මර්සූෆ්, කේ. ශ්‍රී පවන් සහ පී. ඒ. රත්නායක යන විනිසුරුවරුන්ගෙන් සමන්විත ශ්‍රේෂ්ඨාධිකරණයේ සත් පුද්ගල විනිසුරු මඬුල්ලක් විසින්, වක්‍රව පී. බි. ජයසුන්දරට නැවත මුදල් අමාත්‍යාංශයේ ලේකම් ධුරය දැරීමට අවස්ථාව ලබා දෙනු ලැබුවේ, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාව අනුව විධායක ජනාධිපතිහට හිමි අසීමිත බලතල භාවිතා කිරීමට ඉඩ තිබෙන බව සහ ඒ මත ඔහුට අවශ්‍ය ඕනෑම කෙනෙකු පත් කිරීමට හැකි බව නිගමනය කරමිනි. ඒ අනුව පී. බී. ජයසුන්දර නැවත මුදල් අමාත්‍යාංශයේ ලේකම් ධුරයට පත් කරනු ලැබීය.


"A"

ජනාධිපති කාර්යාලය
சனாதிபதி செயலகம்
THE PRESIDENTIAL SECRETARIAT

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
කොළඹ 1. / கொழும்பு 1. / Colombo 1.

July 31, 2008


Dr P B Jayasundera
Secretary
Ministry of Finance & Planning

I refer to your letter dated July 25, 2008, addressed to His Excellency the President.

His Excellency the President appreciates your concerns, but requires you to continue to serve as Secretary to the Ministry of Finance & Planning, until a suitable replacement is found.

Lalith Weeratunga
Secretary to the President

E-mail – prsec@presidentsoffice.lk


"B"

ජනාධිපති කාර්යාලය
சனாதிபதி செயலகம்
THE PRESIDENTIAL SECRETARIAT

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
කොළඹ 1. / கொழும்பு 1. / Colombo 1

English Translation

7th September 2008

Dr. P.B. Jayasundera
Secretary
Ministry of Finance & Planning

Sir,

Releasing from Post

This refers to your Letter dated 25th July 2008 addressed to His Excellency the President on the above matter.

H.E. the President had directed me to inform you that the request made by you to release you from the post of Secretary Ministry of Finance & Planning and from the post of Secretary to the Treasury has been accepted to be effective from 17th September 2008.

I convey my gratitude for the assistance rendered by you in the performance of duties.

Yours faithfully,

Lalith Weeratunga
Secretary to the President

E-mail – prsec@presidentsoffice.lk

Cc:-

1. Secretary to the Prime Minister
2. Secretary to the Cabinet of Ministers
3. Secretary, Ministry of Finance & Planning
4. Secretary, Ministry of Public Administration & Internal Affairs
5. Auditor General
6. Secretary, Public Service Commission

එසේ වූයේ, මුදල් අමාත්‍ය ලේකම් ධුරය දැරීමට පී. බී. ජයසුන්දර විසින් පෙත්සමක් සහ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරමින්, ඉහත කී පෙර ආයාචනය ශ්‍රේෂ්ඨාධිකරණයේ නැවත සලකා බලා, ඉහත කී රාජ්‍ය නිලයන් ඍජුව හෝ වක්‍රව නොදරන බවට ඔහුගේ දිවුරුම් ප්‍රකාශයෙන් දුන් පොරොන්දුවෙන් ඔහුව නිදහස් කරන ලෙසට ඔහු විසින් කරනු ලැබූ ඉල්ලීමකට අනුවය.

පී. බි. ජයසුන්දර විසින්, ශ්‍රේෂ්ඨාධිකරණයේ අවසරයකින් තොරව, පළමු පෙත්සම සහ දිවුරුම් ප්‍රකාශය වෙනස් කරමින්, දෙවන වරටත් පෙත්සමක් සහ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කර තිබූ අතර, එම දිවුරුම් ප්‍රකාශයේ දිවුරුම් වැකි සහ නොතාරිස්වරයාගේ සහතික කිරීමක් නොමැතිව තිබීමෙන්, එහි වලංගු භාවයක් නොතිබුණු බව හෙලිදරව් විය.

33. I respectfully pray that Your Lordships Court be pleased to grant the relief prayed for in the Amended Petition.

Read over and explained to the Affirmant abovenamed and he having understood the contents thereof placed his signature before me on this 21st day of July 2009 at Colombo

25.00

BEFORE ME

JUSTICE OF PEACE/
COMMISSIONER FOR OATHS

එය එළිදරව් වූ පසු, ශ්‍රේෂ්ඨාධිකරණයේ අවසරයක් නොමැතිව, දෙවන වරටත් පෙත්සම වෙනස් කොට, පී. බී. ජයසුන්දර විසින් වෙනත් දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරන ලදී. මෙය ශ්‍රේෂ්ඨාධිකරණයේ රීති වලට පටහැනි වුවත්, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එම අවස්ථාවේදී එකී උල්ලංඝනය කිරීම් පිළිබඳව අන්ධභාවයකින් ක්‍රියා කොට, එම සංශෝධිත පෙත්සම විභාග කිරීමට භාර ගන්නා ලදී. !

පී. බී. ජයසුන්දරට එසේ ශ්‍රේෂ්ඨාධිකරණයේ රීති කඩකිරීමට ඉඩදී තිබූ වකවානුවේදීම, කර්තෘ විසින් මහජන උන්නතිය සුරැකීමට මහා ආන්දෝලනයක් ඇති කල 'හෙජින්' ගනුදෙනු අභියෝගයට ලක්කරමින් ගොනු කල නඩුවක පෙත්සමක් ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අනුමැතිය සහිතව වෙනස් කර තිබියදී, ඉහත කී ප්‍රකාර පි. බී. ජයසුන්දරහට එකී ශ්‍රේෂ්ඨාධිකරණයේ රීති කඩකිරීමට ඉඩ දුන් විනිසුරු ශිරාණි බණ්ඩාරනායක විසින්ම කර්තෘ හට පවසා සිටියේ එසේ පෙත්සමක් වෙනස් කිරීම වරදක් බවත්, පෙත්සමක් වෙනස් කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් කලින් අවසර ගත යුතු බවත් වන අතර, එසේ පවසමින්, කර්තෘට එසේ කටයුතු කිරීමට වෙනත් දිනයක් නියම කරන ලදී. මෙය ක්‍රියාදාමය පරස්පර විරෝධතාවයක් පැමකි. *"Derivative / Hedging Deals by Citibank, Standard Chartered Bank, Deutsche Bank, with Sri Lanka Government's Petroleum Corporation - Dubious & Illegal ?"* ( "ශ්‍රී ලංකා රජයේ ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සමග සිටි බැංකුව, ස්ටැන්ඩර්ඩ් චාටර්ඩ් බැංකුව, ඩොයිෂ් බැංකුව, මගින් සිදු කර ඇති ව්‍යුත්පන්න / හෙජින් ගනුදෙනු - සැක සහිත සහ නීති විරෝධි ?")

පී. බී. ජයසුන්දර ඔහුගේ පෙත්සමෙන් පහත පරිදි අයැද සිටින ලදී.

(අ) 2008.10.08 දිනැති නියෝගය, එපමණකින් ස්ථිර ප්‍රකාශයේ දිවුරුම් ප්‍රකාශය තුල අන්තර්ගතයට සම්බන්ධ වන බැවින්, වත්මන් පෙත්සම්කරු "ඍජු හෝ වක්‍ර අයුරකින් කිසිදු රාජ්‍ය ආයතනයක කිසිදු තනතුරක් දැරීමට හෝ වෙනත් කිසිදු විධායක හෝ පරිපාලනමය කාර්යයන් කිසිදු අයුරකින් අභ්‍යාස කිරීමට අදහස් කල නොහැකිය." යන එකී නියෝගය ඉවත් කරන ලෙස

(ආ) ඔබේ ගරු අධිකරණ නියෝගයේ යෝජනාවක් ප්‍රකාරව වර්තමාන පෙත්සම්කරු විසින් ඉදිරිපත් කරනු ලැබූ 2008.10.16 දිනැති එකී දිවුරුම් ප්‍රකාශයේ 13 වන ඡේදයේ අන්තර්ගත වර්තමාන පෙත්සම්කරුගේ කර්තව්‍යයන් ලිහිල් කිරීමට නියෝග කරන ලෙස සහ එය මෙම අයැදුමෙහි "ඩී" ලෙස සළකුණු කර ඉදිරිපත් කිරීමට නියෝග කරන ලෙස

(ඇ) ඔබගේ ගරු අධිකරණයට ලබා දිය හැකි අනෙකුත් සහ වැඩිදුර සහන ප්‍රදානය කරන ලෙස

ඔහුගේ එම ප්‍රධාන ඉල්ලීම් වලට ප්‍රබල ලෙස විරුද්ධ වූ පෙත්සම්කරු, නීතිඥ වාසුදේව නානායක්කාරගේ තර්ක සහ ඒ සඳහා සහාය වූ කර්තෘගේ තර්ක මත, ඉහත කී ප්‍රධාන අයැදීම් දෙක වන (අ) සහ (ආ) සඳහා ඉඩදීමට නොහැකි බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ප්‍රකාශ කර සිටින ලදී.

ශ්‍රේෂ්ඨාධිකරණයේ රීති අනුව, මෙවැනි විමසීමකදී, පාර්ශවකරුවෙකුට ශ්‍රේෂ්ඨාධිකරණයේ වාචික ඉදිරිපත් කිරීම් සිදු කරන්නට අනුමැතිය දෙනු ලබන්නේ, ඔහු විසින් ලිඛිත ඉදිරිපත් කිරීම් සිදු කර තිබුනොත් පමණකි. කර්තෘ පමණක් වගඋත්තරකරුවෙකු ලෙස දීර්ඝ වශයෙන් ලිඛිත ඉදිරිපත් කිරීම් ගොනු කර තිබුණත්, එවැනි ලිඛිත ඉදිරිපත් කිරීම් ගොනු කර නොසිටි පී. බී. ජයසුන්දරගේ නීතිඥවරයාට බොහෝ වේලාවක් වාචික ඉදිරිපත් කිරීම් සිදු කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අවස්ථාව ලබා දී තිබුණි.

එනමුත්, ශ්‍රේෂ්ඨාධිකරණයේ ක්‍රියා පටිපාටිය වූ වාචික ඉදිරිපත් කිරීම් සිදු කිරීමට, ශ්‍රේෂ්ඨාධිකරණයේ රීති අනුව ලිඛිත ඉදිරිපත් කිරීම් සිදු කල කර්තෘහට පරම අයිතියක් තිබුණද, පවතින සීමිත කාලය සළකා, ඔහුගේ වාචික ඉදිරිපත් කිරීම් විනාඩි 10 කින් නිමා කරන මෙන් අගවිනිසුරු අසෝක ද සිල්වා විසින් කර්තෘගෙන් ඉල්ලා සිටි අතර, එනමුදු මෙම සත් පුද්ගල විනිසුරු මඩුල්ල විශේෂයෙන්ම පී. බී. ජයසුන්දර විසින් ඉදිරිපත් කරන ලද ඉහත අයදුම්පත්‍රය විභාග කිරීම සඳහා සිය සම්පූර්ණ දිනයම ගත කර තිබුණි.

ඉහත කී පසුබිම මත, එවකට ජ්‍යෙෂ්ඨතම විනිසුරු වූ ශිරාණි බණ්ඩාරනායක මෙම කරුණු සම්බන්ධයෙන් මහත් උනන්දුවක් දක්වමින් නැවත නැවතත් ප්‍රකාශ කරන ලද්දේ, කෙසේ හෝ සහනයක් ලබාදිය යුතු බවත්, එම සහනය තෙවන අවසන් අයැදීම වූ (ඇ) *'අධිකරණයට ලබා දිය හැකි අනෙකුත් සහ වැඩිදුර සහන ප්‍රදානය කිරීම'* මත, ජනාධිපති මහින්ද රාජපක්ෂහට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව, නැවත පී. බී. ජයසුන්දරව පත්කිරීමට බාධාවක් නොමැති බවත්ය. මේ අනුව, ප්‍රධාන සහන ප්‍රතික්ෂේප කර ඇති විට *'අනෙකුත් සහ වැඩිදුර සහන'*, ප්‍රදානය කල හැකි ආකාරය පිළිබඳ ප්‍රශ්නයක් මතුවේ ?

එනමුත් ඉහත කී ස්ථාවරයට එකඟ නොවෙමින් නිර්භීත විනිසුරුවරික් වූ ශිරාණි තිලකවර්ධන පෙන්වා දී තිබුණේ, පී. බී. ජයසුන්දරගේ පෙත්සම් සංශෝධනය කිරීමට කලින් ශ්‍රේෂ්ඨාධිකරණයේ අවසරය ගෙන නොතිබීමෙන් සහ ඔහුගේ එක දිවුරුම් ප්‍රකාශක් ඉහත කී අන්දමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ රිති වලට පටහැනිව තිබීමෙන්, ඔහුගේ ඉල්ලීම අනිවාර්යයෙන්ම ප්‍රතික්ෂේප කල යුතු බවය. තවද විධායක ජනාධිපතිට අසීමිත බලයක් භාවිතා කිරීමට අවස්ථාව නැතැයිද ප්‍රකාශ කර, සදාචාර විරෝධතාවයන් සහ ප්‍රජාතන්ත්‍රවාදය මත, රජයේ සියලු පාලන ආයතන, ව්‍යවස්ථානුකූලව සහ නීත්‍යානුකූලව, නීතිය අනුව පිහිටා ක්‍රියාකල යුතු බව නිගමනය කරන ලදී.

ශිරාණි තිලකවර්ධන විනිසුරුවරියගේ විසම්මතික නඩු තීන්දුවේ සම්පූර්ණ පිටු දෙකක් යටපත් කර අතහැර තිබුණේ, කූට ලෙස අකුරු වර්ගය සහ වදන් වල ප්‍රමාණය පරිගණකයෙන් විශාල කිරීමෙන් බව කර්තෘට අවබෝධ විය. මෙය සිදු කර ඇත්තේ, අකුරු විශාල ප්‍රමාණයකට වෙනස් කර, එනම් පළමුවන පිටු 15 හි 'සෙන්චරි ගොතික් ෆොන්ට්' හි අකුරුවල ප්‍රමාණය විශාල කර දක්වා, එමගින් පිටු 17 වන සේ විශාල කොට, එම විශාල කල පිටු 16 සහ 17 ඉවත් කිරීමෙන් එහි අඩංගු ජනාධිපතිවරයාගේ ව්‍යවස්ථාපිත වගකීම් යටපත් කිරීමෙනි.

ඉන්පසුව එම විශාල අකුරු සහිත එනම් 'සෙන්චරි ගොතික් ෆොන්ට්' අකුරු සහිත පළමුවන පිටු 14 ක් පත්‍රිකා 7 ක දෙපැත්තේ ඡායා පිටපත් කර, 8 වන පත්‍රිකාවේ ඉදිරිපස එම විශාල අකුරු එනම් 'සෙන්චරි ගොතික් ෆොන්ට්' සහිත 15 වන පිටුවේ ඡායා පිටපතක් අන්තර්ගත කර ඇති අතර, 8 වැනි පිටුවෙහි පිටුපස පැත්තේ ශිරාණි තිලකවර්ධන විනිසුරුවරියගේ විසම්මතික නඩු තීන්දුවේ කුඩා 'කැලිබ්‍රි අකුරු' සහිත ශිරාණි තිලකවර්ධන විනිසුරුවරියගේ අත්සන ඇතුලත් අවසන් 16 වන පිටුව සමන්විත වන වන පරිදි, පහත දැක්වෙන සේ ඡායා පිටපත් කර ඇති අතර, පහත පෙන්වා දී ඇති ආකාරයට මෙහි විකෘතිභාවය පෙන්නුම් කරනු ලබන්නේ, 15 වන පිටුව නිසි පරිදි සම්පූර්ණ ඡේදයකින් අවසන් වීමෙන් පසු, 16 වන පිටුව ආරම්භ කරනු ලැබ ඇත්තේ අසම්පූර්ණ ඡේදයකින් බැවිනි. !

Finally can the Court on its own volition free him from this undertaking merely because the President has expressed a concern to have him back? In considering this I am mindful of the fact that despite affidavits being tendered to Court, apologies being made to Court and the findings of the judgment, the Petitioner has *falsely made contrary representations* to the Secretary to the President in letters (marked "A") dated 25th July 2008 and (marked "F") dated 3rd June 2009. In his letters to the Secretary he contradicts the contents of his own affidavit, the submissions of his own counsel made at the time in Court and which is recorded in contemporaneous proceedings, and, in that sense, appears to be uncertain and confused. Did the Petitioner, in his affidavit, mean what he said or has he fabricated his stance? To say the least his word, in its varied contradictions, appears fickle.

13 OCT 2009

15

leads to a halt in the growth of the other. The promptings of a kind compassionate heart or sympathetic urgings must necessarily be bridled in dealing with the resources of the State, for it ultimately belongs to the People and must be in the custodianship of honest, disciplined, hardworking and effective public officers.

I accordingly dismiss the amended petition. No Costs.

JUDGE OF THE SUPREME COURT

13 OCT 2009

SRI LANKA

16

මෙවැනි කූට උපක්‍රමයක් මගින්, ශිරාණි තිලකවර්ධන විනිසුරුවරියගේ එකම විසම්මතික නඩු තීන්දුවේ වැදගත්ම පිටු දෙකක් යටපත් කර, ශ්‍රේෂ්ඨාධිකරණ රේජිස්ට්‍රාර් කාර්යාලය විසින් 2009 ඔක්තෝබර් 13 වන දින එම ව්‍යාජ පිටපත මාධ්‍යයට නිකුත් කිරීමෙන්, එය මත 2009 ඔක්තෝබර් 14 දින මාධ්‍ය වාර්තාවල අනෙකුත් නඩු තීන්දු වලට පුළුල් ප්‍රචාරයක් ලබාදී තිබූ අතර, ඉහත කී වැදගත් කරුණු යටපත් කර තිබූ පිටු දෙකේ සඳහන්, මහජන සුභ සිද්ධිය සඳහා මාධ්‍යයෙහි වාර්තා කල යුතුව තිබූ, ජනාධිපති විසින් විධායක බලය භාවිතා කිරීම පිළිබඳ ව්‍යවස්ථාපිත සීමාවන් ඇති බවට වැදගත් සහ අදාල අන්තර්ගතයන් ගැන මාධ්‍යයන්හි වාර්තා කිරීම වලක්වා තිබුණි. එසේ කරන ලද්දේ, කූට උපක්‍රමශීලි ලෙස එම වැදගත් සහ අදාල නිගමනයන් අඩංගු එම විසම්මතික නඩු තීන්දුව මාධ්‍යයේ පලකිරීම වළක්වා යටපත් කිරීමටය. !

ඉහලම අධිකරණයේ සනාථ වූ මහා පරිමාණ රාජ්‍ය දේපලකට වංචා කිරීම පිළිබඳව ඉහත කී ශ්‍රේෂ්ඨාධිකරණ නඩුවේ, පොලිස්පති, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා සුරැකුම් හා විනිමය කොමිෂන් සභාව ඇතුළු අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව පාර්ශවකරුවන් කර තිබුණද, නඩු තීන්දුවෙන් පසු, එම ආයතන වලට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ක්‍රියාමාර්ග ගැනීමට තීන්දු කර තිබූ නමුත් සහ ඒ සඳහා තවදුරටත් පැමිණිලිද ඉදිරිපත් කර තිබූ නමුත්, මෙම මහා පරිමාණ මහජන දේපල වංචා කිරීම් පිළිබඳව මෙම ආයතන කිසිදු පියවරක් නොගැනීමත්, නීතිය බලාත්මක කරන ආයතන පුදුම සහගත ලෙස ප්‍රශ්නකාරී නිහඬ පිළිවෙතක් අනුගමනය කිරීමත්, සැලකූ විට ඒ අනුව නීතියේ ආධිපත්‍යය බලාත්මක කිරීම හුදු විහිලුවක් පමණක් විය.

ඉහත සඳහන් කරුණු මත වරදවල් වලට එරෙහි 1982 අංක 12 දරණ මහජන දේපල පනත අනුව වහාම පහත පියවර ගත යුතුව තිබුණි -

1. මහජන දේපල වලට අලාභ කිරීම
2. මහජන දේපල සොරකම් කිරීම
3. මහජන දේපල මංකොල්ල කෑම
4. මහජන දේපල මත අනිසි ලෙස හා විශ්වාසය කඩ කිරීම

5. මහජන දේපල මත වංචා, කූට ලේඛන සැකසීම, හෝ විකෘත කිරීම
6. ඉහත ඕනෑම වරදක් කිරීමට උත්සාහ ගැනීම

එනමුත් ඉහත කී ප්‍රකාර කිසිදු අයුරකින් කිසිම පියවරක් නොගන්නා ලදී. !